ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අප්‍රේල් මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 1.10 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

එල්.ඩී.-ඕ. 43/77

සංස්ථාගත කිරීමේ නියමයෙහි සඳහන් යම් විස්තරයක රක්ෂණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතින් පිහිටුවන ලද රක්ෂණ සංස්ථාවේ අනුසංස්ථා සහ වෙනත් ස්වාධීන සංස්ථා පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනත සහ 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත සංශෝධනය කිරීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### අනුසංස්ථා සහ ස්වාධීන සංස්ථා පිහිටුවීම

අනුසංස්ථාවක් පිහිටුවීම සඳහා සංස්ථාගත කිරීමේ නියමය.

2. (1) යම් විස්තරයක රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම පිළිබඳ අයිතිවාසිකම රක්ෂණ සංස්ථාවට අතිරේකව වෙනත් යම් රක්ෂණකරුවකු වෙත දීර්ඝ කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින් මතු " සංස්ථාගත කිරීමේ නියමය " යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයකින් ආණ්ඩුවේ අනුමතය ඇතිව ඔහු විසින්—

(අ) ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් විස්තරයක රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා රක්ෂණ සංස්ථාවේ අනුසංස්ථාවක් පිහිටුවනු ලැබිය යුතු යයි ප්‍රකාශ කිරීම ;

(ආ) අනුසංස්ථාවට සංස්ථාගත නාමයක් නියම කිරීම ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුදල් ප්‍රමාණය නොඉක්මවන පරිදි අනුසංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය නිශ්චය කිරීම ;

(ඈ) අනුසංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය දැක්වීම ;

(ඉ) අනුසංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව නියම කිරීම ;

(ඊ) 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අනුසංස්ථාවේ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම ;

(උ) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා වශයෙන් පත් කිරීම ;

(ඌ) අනුසංස්ථාව ස්වකීය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුත්තේ යම් දිනයක ද ඒ දිනය නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

2—ඒ 39501—10,825 (79/01)

(2) සංස්ථාගත කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, ඒ නියමයෙහි සඳහන් සංස්ථා නාමය හා අවිච්ඡින්න පැවැත්මක් ඇති 7 වන වගන්තිය ප්‍රකාර තත්කාලය සඳහා එහි සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත අනුසංස්ථාවක් පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාගත නාමයෙන් අනුසංස්ථාව විසින් නඩු පැවරීම ද අනු සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(4) අනුසංස්ථාවක ආරම්භක ප්‍රාග්ධනයේ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වාරිකවලින් රක්ෂණ සංස්ථාවේ අරමුදලින් එම සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ස්වාධීන සංස්ථාවක් පිහිටුවීම සඳහා සංස්ථාගත කිරීමේ නියමය.

3. (1) සංස්ථාගත කිරීමේ නියමයෙහි සඳහන් යම් විස්තරයක රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා රක්ෂණ සංස්ථාව හා එහි අනුසංස්ථාවලට අතිරේකව ස්වාධීන සංස්ථාවක් පිහිටුවීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු " සංස්ථාගත කිරීමේ නියමය " යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයකින් ආණ්ඩුවේ අනුමතය ඇතිව ඔහු විසින්—

(අ) ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් විස්තරයක රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා ස්වාධීන සංස්ථාවක් පිහිටුවනු ලැබිය යුතු යයි ප්‍රකාශ කිරීම ;

(ආ) ඒ ස්වාධීන සංස්ථාවට සංස්ථාගත නාමයක් පැවරීම ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුදල් ප්‍රමාණය නොඉක්මවන පරිදි ස්වාධීන සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය නිශ්චය කිරීම ;

(ඈ) ඒ ස්වාධීන සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය දැක්වීම ;

(ඉ) ඒ ස්වාධීන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව නියම කිරීම ;

(ඊ) 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ ස්වාධීන සංස්ථාවේ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම ;

(උ) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු එහි සභාපති වරයා වශයෙන් පත් කිරීම ;

(ඌ) ඒ ස්වාධීන සංස්ථාව විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතු දිනය නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාගත කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, නියමයෙහි සඳහන් සංස්ථා නාමය හා අවිච්ඡින්න පැවැත්මක් ඇති 7 වන වගන්තිය ප්‍රකාර තත්කාලය සඳහා එහි සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත ස්වාධීන සංස්ථාවක් පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාගත නාමයෙන් ස්වාධීන සංස්ථාවක් විසින් නඩු පැවරීම ද ස්වාධීන සංස්ථාවකට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(4) ස්වාධීන සංස්ථාවක ආරම්භක ප්‍රාග්ධනයේ මුදල් ප්‍රමාණය මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වාරිකවලින් ඒකාබද්ධ අරමුදලින් එම සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

## II වන කොටස

### අනුසංස්ථාවලට සහ ස්වාධීන සංස්ථාවලට අදාළ විධිවිධාන

4. මේ කොටසෙහි විධිවිධාන (මින් මතු මේ කොටසෙහි "සංස්ථාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ පිහිටුවනු ලැබූ අනුසංස්ථාවකට හා ස්වාධීන සංස්ථාවකට අදාළ විය යුතු ය. මේ කොටසේ විධිවිධාන අනුසංස්ථාවලට හා ස්වාධීන සංස්ථාවලට අදාළ විය යුතු බව.

5. (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය යුතු ය.

6. (1) සංස්ථාවක සාමාන්‍ය පාලනය, අධීක්ෂණය හා පරිපාලනය සහ ව්‍යාපාර කටයුතු මණ්ඩලය සතු විය යුතු ය. සංස්ථාවේ සාමාන්‍ය පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය සතු බව.

(2) සංස්ථාවේ සියලු බලතල හෝ ඉන් කිසිවක් හෝ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් තත්කාලයෙහි ධුර දරන තැනැත්තන් සංස්ථාවේ සාමාජිකයන් විය යුතු ය. සංස්ථාවේ සාමාජිකයෝ.

8. (1) සංස්ථාගත කිරීමේ නියමයෙන් නියම කරනු ලැබුවා වූ ද අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබුවා වූ ද තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් සංස්ථාවට විය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් නැතහොත් මන්ත්‍රීවරයකු වුවහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු වීමට හෝ නුසුදුස් සකු විය යුතු ය.

(3) (අ) සෑම සාමාජිකයකු ම, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු මිය ගිය විට හෝ ඉල්ලා අස්වූ විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට එසේ මිය ගිය, ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත් නැතහොත් මිය යාම හෝ ඉවත් කරනු ලැබීම නිසා ඔහු ධුරය හිස් කරතහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා අමතා යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් මගින් යම් සාමාජිකයකුට මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන්නේ නම් අමාත්‍යවරයා විසින් ඒ වෙනුවෙන් යම් හේතුවක් නොදක්වා ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) රෝගාතුර වීම හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ මණ්ඩලයේ සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීමට වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. කාලය ඉකුත් වීම නිසා ධුරය හිස් කරන අධ්‍යක්ෂවරයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(7) සංස්ථාව විසින් එළඹෙන ලද හෝ එළඹීමට යෝජනා කරන ලද ගිවිසුමක කෙලින් ම හෝ අන්‍යාකාරයකින් කවර වූ හෝ ආකාරයක සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඔහුගේ සම්බන්ධතාවයේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී අනාවරණය කළ යුතු අතර, එම අනාවරණය කිරීම ඒ මණ්ඩලයේ වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතු ය. තවද ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් නිශ්චය කිරීමක දී හෝ තීරණය කිරීමක දී ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

අධ්‍යක්ෂවරයන්ගේ පාරිශ්‍රමික.

9. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකහත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික සංස්ථාවේ අරමුදල්වලින් සියලු ම අධ්‍යක්ෂවරයන්ට හෝ යම් අධ්‍යක්ෂවරයකුට හෝ ගෙවනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා.

10. (1) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් සභාපතිවරයා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස වෙනත් යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ සභාපතිවරයා සභාපති ධුරය හිස් කරතහොත් මිස, ඔහු ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටින කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) අමාත්‍යවරයා අමතා යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වූ යම් සාමාජිකයකුගේ පත්වීම අවසන් කිරීම අවශ්‍ය යයි තමා සලකන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වා මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වූ ඒ සාමාජිකයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි අතර ඒ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් වෙනත් යම් සාමාජිකයකු ඔහු විසින් පත් කරනු ලැබිය හැකි ය.

**11.** (1) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙන්කු විය යුතු ය. සභාපතිවරයා පැමිණ සිටී නම් මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම ඔහු මූලාසනය දැරිය යුතු ය. එවැනි රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටෙක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය ගත යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්වල දී කාර්ය පටිපාටිය.

(2) ඒ මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

**12.** මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ දී යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

පුරප්පාඩුවක් තිබීම නිසා ක්‍රියා අවලංගු නොවන බව.

**13.** (1) සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය සංස්ථාගත කිරීමේ නියම යෙහි සඳහන් මුදල විය යුතු ය.

සංස්ථාවේ ප්‍රාග්ධනය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් මුදලකින් සංස්ථාවේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

**14.** අමාත්‍යවරයා විසින්—

ප්‍රාග්ධනය කොටස්වලට බෙදීම සහ වෙන් කිරීමේ පදනම.

(අ) කොටස්වලට බෙදීම සඳහා වෙන් කරනු ලබන ආරම්භක ප්‍රාග්ධනයේ මුදල් ප්‍රමාණය ;

(ආ) එවැනි එක් එක් කොටසට වෙන් කරනු ලැබිය යුතු වටිනාකම ;

(ඇ) (i) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට ; සහ

(ii) ඒ සංස්ථාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබූ කම්කරුවන්ට යම් කොටස් වෙන් කර දෙනු ලබන්නේ නම් ඒ කොටස් වෙන් කිරීමේ පදනම

නිශ්චය කළ හැකි ය.

**15.** මණ්ඩලය විසින් එක් පොතක හෝ ඊට වැඩි ගණනක කොටස්කරුවන් පිළිබඳ ලේඛනයක් තබා ගත යුතු අතර, එහි පහත දැක්වෙන විස්තර ඇතුළත් කළ යුතු ය :—

කොටස් කරුවන්ගේ ලේඛනය.

(අ) කොටස්කරුවන්ගේ නම සහ ලිපින සහ රක්ෂාවක් ඇතොත්, ඒ රක්ෂාව සහ එක් එක් කොටස එහි අංකයෙන් වෙන් කොට දක්වමින් එක් එක් කොටස්කරු විසින් දරනු ලබන කොටස් පිළිබඳ ප්‍රකාශයක් ;

(ආ) එක් එක් කොටස්කරුගේ නම කොටස්කරුවන්ගේ ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ දිනය ; සහ

(ඇ) යම් කොටස්කරුවකු, කොටස්කරුවකු වීම අවසන් වූ දිනය.

සංස්ථාවේ අරමුදල.

**16.** (1) සංස්ථාවට සංස්ථාවේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට—

(අ) 13 වන වගන්තිය යටතේ සංස්ථාවට ගෙවනු ලබන මුදල් ;

(ආ) සංස්ථාව විසින් නිකුත් කරනු ලැබූ රක්ෂණ ඔප්පු වෙනුවෙන් වාරික වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ස්වකීය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී හෝ මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කටයුතු කිරීමේ දී හා කාර්ය ඉටු කිරීමේ දී සංස්ථාවට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ අරමුදලින්—

(අ) සංස්ථාව විසින් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු යටතේ වූ සංස්ථාවේ බැරකම නිදහස් කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) ස්වකීය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී හෝ මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කටයුතු කිරීමේ දී හා කාර්ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදම් පියවීම පිණිස අවශ්‍ය සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු.

**17.** 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ 5 වන වගන්තියේ විධිවිධාන මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් ද, ඒ වගන්තියෙහි ''සංස්ථාව'' සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම ''සංස්ථාවක්'' සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**18.** 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ 6 වන වගන්තියේ (ඇ) සහ (උ) ඡේදවල විධිවිධාන හැර ඒ වගන්තියේ සෙසු විධිවිධාන, මේ පනතේ විධිවිධාන වූවාක් මෙන් ද, ඒ වගන්තියෙහි ''සංස්ථාව'' සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම ''සංස්ථාවක්'' සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

සංස්ථාවේ ගිවිසුම.

**19.** 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ හා පවත්වා ගෙන යාමේ හෝ මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ, කටයුතු කිරීමේ හා කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම ද ඒවා ඉටු කිරීම ද සංස්ථාව විසින් කළ හැකි ය.

සංස්ථාවේ කාර්ය මණ්ඩලය.

**20.** (1) කාර්යක්ෂම ලෙස මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කිරීම හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් හා සේවකයන් සංස්ථාවක් විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත, ඒ සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි අතර සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විෂයයෙහි විනය පාලනය ද සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) රක්ෂණ සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථාවකට මාරු කිරීම හෝ මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථාවක් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, රක්ෂණ සංස්ථාවට මාරු කිරීම හෝ අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි අතර එසේ මාරු කරනු ලබන නිලධරයකු හෝ සේවකයකු, කලින් සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් නියම හා කොන්දේසි මත ද ඒ නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසි සහගත නොවන නියම හා කොන්දේසි මත ඔහු ඒ ධුරය හෝ සේවය දැරිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සංස්ථාවකට යම් නිලධරයකු හෝ සේවකයකු මාරු කරනු ලැබූ දිනයට ඉහතින් ම වූ දිනයෙහි රක්ෂණ සංස්ථාව යටතේ ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සේවා කාලය, ඔහු මාරු කරනු ලැබුවේ යම් සංස්ථාවකට ද ඒ සංස්ථාව යටතේ සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) මේ පනත යටතේ පිහිටුවනු ලැබූ යම් සංස්ථාවක් යටතේ වූ යම් නිලධරයකු හෝ සේවකයකු රක්ෂණ සංස්ථාවට මාරු කරනු ලැබූ දිනයට ඉහතින් ම වූ දිනයෙහි ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සේවා කාලය ඔහු මාරු කරනු ලැබූ රක්ෂණ සංස්ථාව යටතේ සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මගින් සංස්ථාවක නිලධරයකු හෝ සේවකයකු වෙනත් සංස්ථාවකට මාරු කරනු ලැබූ අවස්ථාවක, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදලේ ම ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ හෝ ගිණුමේ බැරට ඇති සම්පූර්ණ මුදල, ඒ පනතේ 23 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද (6) වන උපවගන්තිය යටතේ දායක මුදල් ප්‍රේෂණය කරනු ලැබීමට නියමිත ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, ඔහු මාරු කරනු ලැබුවේ යම් සංස්ථාවකට ද ඒ සංස්ථාව සමඟ ඔහුගේ සේවය ඔහු අවසන් කළ විට ඔහුට එය ගෙවනු ලැබිය යුතු ය.

(5) යම් සංස්ථාවක යම් ධුරයකට හෝ සේවයකට (2) වන උප වගන්තිය යටතේ මාරු කරනු ලැබූ යම් නිලධරයකුට හෝ සේවකයකුට ඒ ධුරයේ හෝ සේවයේ කාර්ය ඉටු කිරීමට හා කටයුතු කිරීමට සැලැස්වීම හා අවසර දීම ඒ සෑම සංස්ථාවක් විසින් ම කළ යුතු අතර ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ වේතනය හා දීමනා සංස්ථාව විසින් ස්වකීය අරමුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.

(6) සෑම සංස්ථාවක් විසින් ම එහි එක් එක් නිලධරයා හා සේවකයා වෙනුවෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදලට, ඒ පනතින් නියම කරනු ලබන යම් ප්‍රමාණවල දායක මුදල් ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

රක්ෂණ සංස්ථාව සමඟ ප්‍රතිරක්ෂණය කිරීම සෑම සංස්ථාවකම යුතුකම බව.

**21.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද සෑම සංස්ථාවක් විසින් ම, ඒ සංස්ථාව විසින් ඇතුළත් වූ හෝ අලුත් කරනු ලැබූ සෑම රක්ෂණ ගිවිසුමක් යටතේ වූ බැරකමවලින්, නියෝග මගින් නියම කරනු ලබන ප්‍රතිශතයක් රක්ෂණ සංස්ථාව සමඟ ප්‍රති රක්ෂණය කළ යුතු අතර, ඒ ප්‍රතිරක්ෂණය සඳහා රක්ෂණ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලැබූ කොමිස් මුදලක් රක්ෂණ සංස්ථාවෙන් ලැබීමට එවැනි සෑම සංස්ථා වකට ම හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, සංස්ථාවක් විසින් රක්ෂණ සංස්ථාව සමඟ කරනු ලබන ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් රක්ෂණ සංස්ථාව විසින් නියම කරනු ලබන වාර්තා ඒ සෑම සංස්ථාවක් විසින් ම රක්ෂණ සංස්ථාවට කලින් කල සපයනු ලැබිය යුතු ය.

සංස්ථාව වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය ලැබූ තැනැත්තෝ.

**22.** සංස්ථාව වෙනුවෙන් යම් විනිමය බිල් පත්‍රයක්, චෙක්පතක් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇණවුමක් සෑදීමට, ලිවීමට, භාර ගැනීමට හෝ පිටසන් කිරීමට නැතහොත් සංස්ථාව වෙත යම් වගකීමක් පැවරෙන පරිදි හෝ අන්‍යාකාරයකින් සංස්ථාවේ කීර්තිය ඔඩපනය වන පරිදි යම් ගිවිසුමකට ඇතුළත් වීමට හෝ අධ්‍යක්ෂවරයකු හෝ මණ්ඩලය විසින් ප්‍රකාශිතව බලය දෙනු ලැබූ තැනැත්තකු හෝ නොවන කිසිම තැනැත්තකුට බලය නොතිබිය යුතු ය.

ලදු පත්.

**23.** අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් හෝ ලදු පත් අත්සන් කිරීමට මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ අත්සන් කරන ලද ලදු පත් සංස්ථාව වෙත ගෙවන ලද මුදල් එසේ ගෙවන ලද බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය.

කළමනාකරණ සේවා සැලසීම.

**24.** ස්වකීය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම පිණිස යම් සංස්ථා වකට අවශ්‍ය කළමනාකරණ සේවා සලසන ලෙස ඒ සංස්ථාව විසින් රක්ෂණ සංස්ථාවෙන් ඉල්ලා සිටිනු ලැබූ විට, රක්ෂණ සංස්ථාව විසින් ඒ සේවා සැලසිය යුතු අතර, ඒ සේවා සැලසීම සඳහා රක්ෂණ සංස්ථාව විසින් ගාස්තු අය කරනු ලැබිය හැකි ය.

සංස්ථාවක ලාභ.

**25.** සංස්ථාවක ලාභ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන සුරැකුම් මත ආයෝජනය කරනු ලැබිය හැකි ය. නැතහොත් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි කොටස් මත ලාභාංශයක් වශයෙන් ප්‍රකාශයට පත් කොට ගෙවනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාගේ බලතල.

**26.** අමාත්‍යවරයා විසින් සංස්ථාව විමසා ඒ සංස්ථාවේ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තමා අවශ්‍ය යයි සලකන සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, ඒ සංස්ථාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමට අමාත්‍යවරයා සතු බලය.

**27.** (1) සංස්ථාවක දේපළ සහ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් තමාට අවශ්‍ය විය හැකි ආකාරයකින් වාර්තා, ගිණුම් හා වෙනත් තොර තුරු සපයන ලෙස යම් සංස්ථාවකට අමාත්‍යවරයා විසින් කලින් කල විධාන කරනු ලැබිය හැකි අතර, ඒ සංස්ථාව විසින් එවැනි සෑම විධානයක් අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සංස්ථාවක සියලු කටයුතු හෝ ඒවායින් යම කටයුත්තක් සම්බන්ධයෙන් විමර්ශනය කරනු ලැබ වාර්තා කරනු ලැබීමට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීම පිණිස ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය විය හැකි පහසුකම් සැලසීම හා සියලු තොරතුරු සැපයීම මණ්ඩලය විසින් ද ඒ සංස්ථාවේ සෑම නිලධරයකු, සේවකයකු සහ අනුයෝජිතයකු විසින් ද කරනු ලැබිය යුතු ය.

**සමාගම් ආඥාපනතේ විධිවිධාන අදාළ කිරීම.**

28. (1) සමාගම් ආඥාපනතේ හෝ සමාගම් සංස්ථාගත කිරීම විධිමත් කරන වෙනත් යම ලිඛිත නීතියක හෝ විධිවිධාන සංස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ ආඥාපනතේ හෝ තත් කාලයෙහි බලපවත්නා සමාගම්වලට අදාළ වෙනත් යම ලිඛිත නීතියක හෝ විධිවිධාන අතුරින් එක් විධිවිධානයක් හෝ ඊට වැඩි ගණනක් ඒ සංස්ථාව කෙරෙහි අදාළ විය යුතු යයි ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයා අදහස් කරන කවර හෝ විටක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන යම නියමයක්, එහි අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

**අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන් හානිපූරණය කිරීම.**

29. සංස්ථාවක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් ඕනෑකමින් ම කරන ලද ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් සිදුවන පාඩු හැර ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සේවකයා විසින් ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ ඒ කාර්යයන්ට අදාළව හෝ ඔහු විසින් දරන ලද සියලු පාඩු සම්බන්ධයෙන් ඒ සංස්ථාව විසින් ඒ සෑම අධ්‍යක්ෂවරයකු ම, නිලධරයකු ම හෝ සේවකයකු ම හානිපූරණය කරනු ලැබිය යුතු ය.

**නියෝග.**

30. (1) මෙ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) සංස්ථාවේ කටයුතු පවත්වා ගෙන යාම සහ කළමනාකරණය ;

(ආ) සංස්ථාවේ ව්‍යාපාර කටයුතු පාලනය කිරීම ; සහ

(ඇ) නියමිත හෝ නියෝග සෑදීමට මෙ පනතින් බලය දෙනු ලැබූ හෝ වෙනත් යම කාරණයක්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක්, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

31. සංස්ථාවේ සියලු නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

32. අල්ලස් පනතේ අර්ථානුකූලව සංස්ථාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

33. මේ පනතේ මේ කොටසෙහි—

"මණ්ඩලය" යන්නෙන් සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ ;

"ප්‍රාග්ධනය" යන්නෙන් සංස්ථාවේ තත් කාලයෙහි වූ ප්‍රාග්ධනය අදහස් වේ ;

"සංස්ථාව" යන්නෙන් 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අනුසංස්ථාවක් හෝ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ස්වාධීන සංස්ථාවක් හෝ අදහස් වේ.

## III වන කොටස

## විවිධ කරුණු

අනුසංස්ථාවක් විසුරුවා හැරීම.

34. (1) අනුසංස්ථාවේ ව්‍යාපාරික කටයුතු කර ගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන ආකාරය පිළිබඳව අමාත්‍යවරයා සෑහීමට පත් නොවන අවස්ථාවක, ඔහු විසින් රක්ෂණ සංස්ථාව විමසීමෙන් පසු, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අනුසංස්ථාව විසුරුවා හරිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් අනුසංස්ථාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක—

(අ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි වූ අනුසංස්ථාවේ සියලු චංචල හෝ නිශ්චල දේපළ රක්ෂණ සංස්ථාව සතු විය යුතු ය ;

(ආ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි පවත්නා අනුසංස්ථාවේ සියලු ගිවිසුම රක්ෂණ සංස්ථාවේ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද ඒ ගිවිසුම් යටතේ වූ අනුසංස්ථාවේ සියලු අයිතිවාසිකම් හා බැරකම් රක්ෂණ සංස්ථාවේ අයිතිවාසිකම් හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි අනුසංස්ථාවට අය විය යුතු සියලු මුදල් රක්ෂණ සංස්ථාවට අයවිය යුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රක්ෂණ සංස්ථාව විසින් ඒ මුදල් අය කර ගනු ලැබිය හැකි ය ;

(ඈ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි අනුසංස්ථාවෙන් අයවිය යුතු සියලු මුදල් රක්ෂණ සංස්ථාවෙන් අයවිය යුතු මුදල් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රක්ෂණ සංස්ථාවෙන් ඒ මුදල් අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් ස්වාධීන සංස්ථාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින්, ඒ සංස්ථාවේ සේවකයන්ට වෙන් කර දෙන ලද කොටස් වෙනුවට ගෙවිය යුතු වන්දි මුදල නිශ්චය කරනු ලැබිය යුතු ය.

35. (1) ස්වාධීන සංස්ථාවක ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන ආකාරය පිළිබඳව අමාත්‍යවරයා සෑහීමට පත්නොවන අවස්ථාවක, ඔහු විසින් ඒ සංස්ථාව විමසීමෙන් පසුව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ සංස්ථාව විසුරුවා හරිනු ලැබිය හැකි ය. ස්වාධීන සංස්ථාවක් විසුරුවා හැරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් ස්වාධීන සංස්ථාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක—

(අ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි වූ සංස්ථාවේ සියලු චංචල හා නිශ්චල දේපළ රජය සතු විය යුතු ය ;

(ආ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි පවත්නා ඒ සංස්ථාවේ සියලු ගිවිසුම රජයේ ගිවිසුම ලෙස සලකනු ලැබිය යුතු ය. තවද ඒ ගිවිසුම යටතේ වූ ඒ සංස්ථාවේ සියලු අයිතිවාසිකම හා බැරකම් රජයේ අයිතිවාසිකම හා බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි ඒ සංස්ථාවට අයවිය යුතු සියලු මුදල් රජයට අයවිය යුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රජය විසින් ඒ මුදල් අයකර ගනු ලැබිය හැකි ය ; තවද

(ඈ) නියමය පළ කරනු ලැබූ දිනයෙහි ඒ සංස්ථාවෙන් අයවිය යුතු සියලු මුදල් රජයෙන් අයවිය යුතු මුදල් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රජයෙන් ඒ මුදල් අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයකින් ස්වාධීන සංස්ථාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින්, ඒ සංස්ථාවේ සේවක යන්ට, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට වෙන් කර දෙන ලද කොටස් වෙනුවට ගෙවිය යුතු වන්දි මුදල නිශ්චය කරනු ලැබිය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අනුසංස්ථාවකට අදාළ කිරීම.

36. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ අර්ථානුකූලව අනුසංස්ථාවක් රාජ්‍ය සංස්ථාවක් වූවාක් මෙන් ඒ කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ අනුසංස්ථාවේ මුදල් පාලනය හා ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අනුසංස්ථාවක මුදල් වර්ෂය.

37. අනුසංස්ථාවක මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන ස්වාධීන සංස්ථාවකට අදාළ කිරීම.

38. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ස්වාධීන සංස්ථාවක මුදල් පාලනය හා ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ස්වාධීන සංස්ථාවක මුදල් වර්ෂය.

39. ස්වාධීන සංස්ථාවක මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

අර්ථ නිරූපණය.

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"ස්වාධීන සංස්ථාව" යන්නෙන් 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ස්වාධීන සංස්ථාවක් අදහස් වේ ;

"රක්ෂණ සංස්ථාව" යන්නෙන් 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතින් පිහිටුවන ලද රක්ෂණ සංස්ථාව අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් රජය විසින් ආධාරයක්, ණයක් හෝ වෙනත් ආකාරයකින් ප්‍රාග්ධනය සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සලසනු ලැබූ යම් සංස්ථාවක් අදහස් වේ ;

"අනුසංස්ථාව" යන්නෙන් 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අනුසංස්ථාවක් අදහස් වේ.

## IV වන කොටස

### 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතට කරනු ලබන සංශෝධන

1961 අංක 2 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

41. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 2 දරන රක්ෂණ සංස්ථා පනතේ දීර්ඝ නාමයේ "තනි කරම ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ ඊට අතිරේකව වෙනත් සෑම විස්තරයක ම රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා රක්ෂණ සංස්ථාවක් පිහිටුවීම" යන වචන වෙනුවට "ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ ඊට අතිරේකව සෑම විස්තරයක ම රක්ෂණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම සඳහා රක්ෂණ සංස්ථාවක් පිහිටුවීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ පනතේ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

'සංස්ථාව හෝ අනුසංස්ථාවක් හෝ ස්වාධීන සංස්ථාවක් රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලයලත් රක්ෂකයන් විය යුතු බව.

10. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද සංස්ථාව හෝ අනුසංස්ථාවක් හෝ ස්වාධීන සංස්ථාවක් නොවන කිසිම තැනැත්තකුට ශ්‍රී ලංකාව තුළ කවර වූ හෝ යම් පංතියක රක්ෂණ පිළිබඳ අලුත් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට සහ රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට හෝ යම් සාමාන්‍ය රක්ෂණ ඔප්පුවක් අලුත් කිරීමට හෝ බලය නොමැති විය යුතු ය.

(2) සංස්ථාව හෝ අනුසංස්ථාවක් හෝ ස්වාධීන සංස්ථාවක් නොවන යම් රක්ෂණකරුවකු විසින් 1964 ජනවාරි මස පළමුවන දින හෝ ඉන් පසුව නිකුත් කරනු ලැබූ සෑම රක්ෂණ ඔප්පුවක් ම හෝ අලුත් කරනු ලැබූ යම් සාමාන්‍ය රක්ෂණ ඔප්පුවක් ම අවලංගු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව නීතියෙහි ලා එහි කිසිම බලයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය :

එසේ වුව ද 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව ගිවිසුමකට එළඹියේ යම් ව්‍යවසායක් සමඟ ද එවැනි යම් ව්‍යවසායක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයකින් මෙ පනතේ සියලු විධිවිධානවලින් හෝ ඉන් යම් විධිවිධානයකින් අමාත්‍යවරයා විසින් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) මෙ වගන්තියේ '' ව්‍යවසාය '' යන්නෙහි 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) '' සමුපකාර රක්ෂණ දෙපාර්තමේන්තුව '' යන අර්ථකථනය අත් හැරීමෙන් ;

(ආ) '' සංස්ථාව '' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' ස්වාධීන සංස්ථාව '' යන්නෙන් 1979 රක්ෂණ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ස්වාධීන සංස්ථාවක් අදහස් වේ; ' ;

(ඇ) '' නියමිත '' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' අනුසංස්ථාව '' යන්නෙන් 1979 රක්ෂණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අනුසංස්ථාවක් අදහස් වේ ;'.

## V වන කොටස

### රක්ෂණ පාලන පනතට කරනු ලබන සංශෝධනය

1962 අංක 25 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

44. රක්ෂණ පාලන පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

" ලංකා රක්ෂණ සංස්ථාව හා ලංකා රක්ෂණ සංස්ථාවේ අනුසංස්ථාවක් සහ ස්වාධීන සංස්ථාවක් නිදහස් කිරීම.

2. ලංකා රක්ෂණ සංස්ථාව විසින් හෝ ලංකා රක්ෂණ සංස්ථාවේ අනුසංස්ථාවක් විසින් හෝ ස්වාධීන සංස්ථාවක් විසින් හෝ රක්ෂණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාමෙහි ලා මේ පනතෙහි වූ කිසිවක් අදාළ නොවිය යුතුය ; නැතහොත් රක්ෂණ ව්‍යාපාර කටයුතු කර ගෙන යාම මේ පනතෙහි වූ කිසිවකින් තහනම් වන්නේ යයි හෝ සීමා වන්නේ යයි සැලකීම හෝ අර්ථ නිරූපණය කිරීම හෝ කරනු නොලැබිය යුතු ය. ''.